JMC vLearning
"your virtual learning partner"

# පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය සඳහා හැඳින්වීම

## වරලත් ගණකාධිකරණය - ව්‍යාපාර අදියර II

BL6 - කළමනාකරණ ගිණුම්කරණය (MA)

**Pack 01**

උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# පරිච්ඡේදය 1

# පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය සඳහා හැඳින්වීම
# Introduction to Cost and Management Accounting

## පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණයේ ආරම්භය හා පරිනාමය
## EVOLUTION OF COST AND MANAGEMENT ACCOUNTING

මිනිසා භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කර යම් මිලකට විකිණීමට පටන් ගත් දිනය, පිරිවැයකරණයේ ආරම්භක දිනය ලෙස සැලකිය හැක. නමුත් මූලික වශයෙන් පිරිවැයකරණ විෂය යොදා ගන්නා ලද්දේ නිෂ්පාදන ආයතන (Manufacturing Concerns) විසින් පමණි. එනම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන ආයතන විසිනි. නමුත් පසුකාලීනව, පිරිවැයකරණය සේවා නිෂ්පාදන ආයතන විසින් ද යොදා ගැනීමට පෙළඹී ඇත.

උදා: පෞද්ගලික රෝහල් , ප්‍රවාහන සමාගම්, රාජ්‍ය සේවා ආයතන, බැංකු, මූල්‍ය, රක්ෂණ සමාගම් වැනි.

**පිරිවැයකරණය හා පිරිවැය ගිණුම්කරණය**
**Costing and Cost Accounting**

පිරිවැයකරණය හා පිරිවැය ගිණුම්කරණය යනු වෙනස් අර්ථ සහිත සංකල්ප දෙකකි.

**පිරිවැයකරණය (Costing) යනු,**

*ආයතනයක් විසින් නිපදවන භාණ්ඩයක හෝ සේවා ඒකකයක (පිරිවැය ඒකකයක) පිරිවැය සෙවීමේ ක්‍රියාවලියයි.*

**පිරිවැය ගිණුම්කරණය (Cost Accounting)**

පිරිවැයකරණය හා සම්බන්ධව තොරතුරු, කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා මැන දැක්වීම, (Measuring) , විශ්ලේෂණය කිරීම (Analysing), තක්සේරු කිරීම (Estimating), වාර්තා කිරීම (Recording) සහ ඉදිරිපත් කිරීම (Presentation) හා සම්බන්ධ සමස්ථ ක්‍රියාවලියයි.

## ➢ <u>මූල්‍ය ගණකාධිකරණය, පිරිවැය ගණකාධිකරණය හා කළමනාකරණ ගණකාධිකරණය</u>

මේවා ගිණුම්කරණයේ මූලික කොටස් වේ.

**මූල්‍ය ගණකාධිකරණය (Financial Accounting)**

මූල්‍ය ගණකාධිකරණයෙන් ප්‍රධාන වශයෙන් තොරතුරු ලබා දෙන්නේ බාහිර පාර්ශවයන්ටයි.
උදා: කොටස්හිමියන්, ණයහිමියන්/සැපයුම්කරුවන්, මූල්‍ය විශ්ලේෂකයන්, වෘත්තීය සමිති, බැංකුකරුවන්, රාජ්‍ය ආයතන ..... වැනි.

ඉහතින් සඳහන් කළ ව්‍යාපාරය පිළිබඳව තොරතුරු ඉල්ලා සිටින බාහිර පාර්ශවයන්ට [External users of information] ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵල (operational results) පිළිබඳවත් මූල්‍ය තත්වය (financial position) පිළිබඳවත් වාර්තා කිරීම මූල්‍ය ගණකාධිකරණයේ ප්‍රධාන පරමාර්ථය වේ. ව්‍යාපාරයේ යම් අතීත කාලපරිච්ඡේදයක් සඳහා මෙහෙයුම් ප්‍රතිඵල හෙවත් ලාභදායීත්වය (Profitability) දැනගැනීම සඳහා ලාභ / අලාභ ගිණුමත් එම කාල පරිච්ඡේදයේ අග දිනට මූල්‍ය තත්වය දැන ගැනීම සඳහා ශේෂ පත්‍රයත්, එම කාලපරිච්ඡේදය තුළ දී මූල්‍ය තත්වයේ වෙනස් වීම දැන ගැනීම සඳහා මූල්‍ය තත්වය වෙනස් වීමේ/ හිමිකම් ප්‍රකාශයක් පිළියෙල කෙරේ. මේ අනුව මූල්‍ය ගණකාධිකරණය අදාළ වන්නේ අතීත කාලපරිච්ඡේදයකට වේ. [ඉහතින් සඳහන් කළ ලාභාලාභ ගිණුම, ශේෂ පත්‍රය හා මූල්‍ය තත්වය වෙනස් වීමේ ප්‍රකාශය යන එවා එකට ගත් විට "මූල්‍ය ප්‍රකාශන" (Financial Statements) ලෙස හඳුන්වයි.]

**කළමනාකරණ ගණකාධිකරණය [Management Accounting]**

ආයතනයක කළමණාකරුවන්ට, ඔවුන්ගේ සැලසුම් කිරීමේ, තීරණ ගැනීමේ (කෙටි කාලීන හා දිගු කාලීන) හා මෙහෙයුම් පාලනය කිරීමේ කාර්යයන් ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා දත්ත එක් රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ කථනය කිරීම සහ ඒවා ඔවුන්ට විධිමත් ආකාරයට සන්නිවේදනය කිරීමේ සමස්ථ ක්‍රියාවලිය කළමනාකරණ ගණකාධිකරණය නම් වේ. මේ සඳහා කළමනාකරණ ගණකාධිකාරීවරයා විසින් මූල්‍ය හා පිරිවැය ගිණුම්කරණ පද්ධති වලින් ද අදාළ පරිදි තොරතුරු උපුටා ගැනීමක් සිදු කරයි.

- **පිරිවැය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය**
  **[Cost Accounting Vs Managgement Accounting]**

| පිරිවැය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|
| • මෙහිදී විෂය පථය සකස් වනුයේ ඒකකයක පිරිවැය නිශ්චය කිරීම සඳහාය. | • නමුත් මෙහිදී විෂය පථය පුළුල් අර්ථයෙන් නිර්වචනය වේ. එනම් ව්‍යාපාරයේ ලාභදායීත්වය සහ ඵලදායීත්වය වැඩි දියුණු කිරීමටත්, ප්‍රතිපත්ති සකස් කිරීමටත් ආදී ලෙස |
| • මූල්‍ය ගිණුම්කරණයේ තොරතුරු ප්‍රධාන වශයෙන් පදනම් කරගනී. උදා : අමුද්‍රව්‍ය ගැනුම්, වැටුප් ගෙවීම් වැනි වියදම් | • මූල්‍ය ගිණුම්කරණයට හා පිරිවැය ගිණුම්කරණයට අදාළ දත්ත මෙන්ම වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගන්නා දත්ත ද අදාළ කර ගනී. |
| • විවිධ පිරිවැය ක්‍රම භාවිතා කරයි. උදා: කාර්යය පිරිවැයකරණය, පෙරසැරි පිරිවැයකරණය වැනි | • විශේෂිත වූ ගිණුම් ක්‍රම නැත |
| • මෙමගින් කළමනාකරණයට සපයනුයේ පිරිවැය තොරතුරු පමණි. | • නමුත් කළමනාකරණ ගණකාධිකරණය මගින් කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන සියළුම තොරතුරු සැපයීමක් සිදු වේ. |

## ➢ කළමනාකරණ ගණකාධිකරණය හා මූල්‍ය ගණකාධිකරණය [Management Accounting Vs Financial Accounting]

| කළමනාකරණ ගණකාධිකරණය | මූල්‍ය ගණකාධිකරණය |
|---|---|
| • සාපේක්ෂ විෂය පථය පටු වේ. | • පුළුල් විෂය පථයක් සහිතය. |
| • කළමනාකරණ ගිණුම්කරණය කිසිදු නීති රීති, රෙගුලාසි, අනපනත් හෝ ප්‍රමිතිවලට යටත් නොවේ. | • මූල්‍ය ප්‍රකාශන සකස් කරනුයේ අනපනත්, නීති රීති හා රෙගුලාසි හා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව වේ. |
| • හුදෙක් ම අභ්‍යන්තර ක්‍රියාවලියකි. | • අභ්‍යන්තර මෙන්ම බාහිර ක්‍රියාවලියකි. |
| • මූලික වශයෙන් කළමනාකරණයට තොරතුරු සැපයීමක් සිදුවේ. | • ප්‍රධාන වශයෙන් බාහිර පාර්ශවයන්ට තොරතුරු සැපයීමක් සිදු වේ. |
| • තොරතුරු විස්තරාත්මක වේ. | • තොරතුරු සාරාංශ ගත ස්වරූපයක් ගනී. |
| • ව්‍යාපාරයේ සමස්ථ ස්වභාවය පිළිඹිඹු නොකරයි. | • ව්‍යාපාරයේ සමස්ථ ස්වරූපය පිළිඹිඹු කරයි. |
| • ව්‍යාපාරයේ වත්මන් හා අනාගත තොරතුරු භාවිතා කරයි. අතීත තොරතුරු භාවිතා වනුයේ සැලසුම්කරණය සඳහා පාදකයක් ලෙස යි. | • මූලික වශයෙන් ව්‍යාපාරයේ අතීත තොරතුරු භාවිතා කරයි. |

## ➢ මූල්‍ය ගණකාධිකරණය හා පිරිවැය ගණකාධිකරණය [Financial Accounting Vs Cost Accounting]

| ලක්ෂණය | මූල්‍ය ගණකාධිකරණය | පිරිවැය ගණකාධිකරණය |
|---|---|---|
| 1) ගනුදෙනු හඳුනා ගැනීම | නිශ්චිත කාල පරිච්ඡේදයක ගනුදෙනු හඳුනා ගැනේ. | නිශ්චිත ඒකකයක් හෝ කාර්යයක් සම්බන්ධයෙන් හඳුනා ගැනේ. |
| 2) ගනු දෙනු ආවරණය | සම්පූර්ණයෙන්ම එනම් සමස්ථ ව්‍යාපාරයේම ගනුදෙනු ආවරණය වේ. | ගනුදෙනු වලින් කොටසක් පමණක් ආවරණය වේ. (පිරිවැය හා සම්බන්ධ වන ගනු දෙනු) |
| 3) අරමුණු | මෙහෙයුම් ප්‍රතිඵල / ලාභදායීත්වය සොයා බැලීමත් , මූල්‍ය තත්වය හා එහි වෙනස් වීම සොයා බැලීමත්ය. | කළමනාකරණයට, ඔවුන්ගේ සැලසුම් කිරීම්, පාලන හා තීරණ ගැනීම් ක්‍රියාවලියට තොරතුරු සැපයීම වේ. |
| 4) වියදම් වර්ගීකරණය | බොහෝ විට දරණ කාර්යය අනුව වර්ග කරයි. උදා : නිෂ්පාදන, පරිපාලන , විකුණුම් හා බෙදා හැරීම්. | හඳුනාගත හැකි ආකාරය අනුව හෝ වෙනස් වන ආකාරය අනුව වර්ග කෙරේ. <br> - සෘජු වියදම් හා වක්‍ර වියදම් <br> - විචල්‍ය හා ස්ථාවර |

| | | | |
|---|---|---|---|
| 5) | කාර්යක්ෂමතාව | සමස්ථ ව්‍යාපාරයේ කාර්යක්ෂමතාව මැන බැලේ. | දෙපාර්තමේන්තු වශයෙන් හෝ නිෂ්පාදන වශයෙන් ගෙන කාර්යක්ෂමතාව මැන බලයි. |
| 6) | ද්‍රව්‍ය පාලනය | ද්‍රව්‍ය පාලනය පිළිබඳ විශේෂයෙන් අවධානය යොමු නොවේ. | නමුත් ගැනුම් සඳහා, තොග සඳහා ප්‍රතිපත්ති සැකසීමෙන් ද්‍රව්‍ය සඳහා වූ විශේෂ පාලනයක් සිදුවේ. |
| 7) | පද්ධතියේ ස්වාධීන බව | පිරිවැය ගණකාධිකරණයෙන් ස්වාධීන වේ. | නමුත් මූල්‍ය ගිණුම්කරණය මත රඳා පවතී. |
| 8) | ප්‍රතිඵල සැසඳීමේ අවශ්‍යතාවය | මූල්‍ය ගිණුම්කරණය තනිව ගත් විට සැසඳීම අවශ්‍ය නොවේ. | පිරිවැය ගිණුම්කරණ වාර්තා හා මූල්‍ය ගිණුම්කරණ වාර්තා සැසඳීමක් නිරන්තරයෙන්ම සිදුවේ. |
| 9) | නාස්තිවීම් / අපතේ යාම් හඳුනා ගැනීම | නාස්තිවීම් හා අපතේ යාම් හඳුනා ගැනීමක් සිදු නොවේ. | නාස්තිවීම් හා අපතේයාම් හඳුනා ගැනේ. ඒවා සාමාන්‍ය හා අසාමාන්‍ය ලෙස වර්ගීකරණයක් ද සිදු වේ. අසාමාන්‍ය අපතයන් අවම කිරීමට ක්‍රියාත්මක වේ. |
| 10) | ගනුදෙනු | බාහිර ගනුදෙනු පිළිබඳව අවධානය යොමු වේ. | හුදෙක් ම අභ්‍යන්තර ගනුදෙනු පිළිබඳව අවධානය යොමු වේ. |
| 11) | තොරතුරු අදාළ වන කාලය | අතීතයේ සිදු වූ සත්‍ය ගනුදෙනු පදනම් කරගනී. | සිදු වූ සත්‍ය ගනු දෙනු හා පුරෝකථන භාවිතා වේ. |
| 12) | තොග අගය කිරීම | පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට තොගය අගය කෙරේ. | තොගය අගය කරනුයේ පිරිවැයටයි. |
| 13) | නීතිමය අවශ්‍යතාවයන් සපුරාලීම | සමාගම් පනත, බදු පනත් හා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකුල විය යුතුයි. | කළමනාකරණයේ තොරතුරු අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා ආයතනය විසින් ම සම්මත කරගත් ආකාරයට තොරතුරු ඉදිරිපත් කෙරේ. |

**පිරිවැය (Cost) යනු:**

*යම් භාණ්ඩයක් හෝ සේවා ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කළ සම්පත් වල මූල්‍යමය වටිනාකම පිරිවැය ලෙස සැලකේ.*

උදා :

| X භාණ්ඩ ඒකකයක | | රු. |
|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් | 5 × 10/- | 50 |
| සෘජු ශ්‍රමය පැය | 2× 20/- | 40 |
| අනෙකුත් වියදම් | | 10 |
| ∴ පිරිවැය | | 100 |

එනම්,

| | | | | |
|---|---|---|---|---|
| **පිරිවැය** | **=** | **සම්පත් පරිභෝජනය** | **×** | **සම්පත් ඒකකයක මිල** |

එනම්, සම්පත් පරිභෝජනයේ වෙනසක්, මිලෙහි වෙනසක් හෝ එම දෙකෙහිම වෙනසක් මත ''පිරිවැය'' වෙනස් වේ.

## පිරිවැය ඒකකය (Cost unit / Cost Objects)

පිරිවැයකරණයේදී පිරිවැය ගණනය කරනුයේ කුමකද? එය පිරිවැය ඒකකය නම් වේ. පිරිවැය ගණනය කිරීමේදී හැමවිටම, පිරිවැය යන්න කුමන හෝ පිරිවැය ඒකකයකට සම්බන්ධ කර ගණනය කළ යුතුයි. (A unit of product of service in relation to which costs are ascertained)

උදා :

| **කර්මාන්තය** | **පිරිවැය ඒකකය** |
|---|---|
| විදුලි බලය නිපදවන ආයතනයක | කිලෝවොට් පැය (Kwh) |
| බේකරියක | පාන් ගෙඩියක් |
| අධ්‍යාපන ආයතනයක | එක් සිසුවෙක්/ පංතියක් |
| ගඩොල් පෝරණුවක | ගඩොල් 1000 |
| ඉදි කිරීම් කොන්ත්‍රාත්තු ආයතනයක | එක් කාර්යයක් / වර්ග අඩියක් |
| පෞද්ගලික රෝහලක | එක් රෝගියෙකුගේ දිනක් / එක් ශල්‍ය කර්මයක් |
| ජලසම්පාදනය | එක් ජල ලීටරයක් / ගැලුමක් |
| හෝටලයක | එක් කෑම පිඟානක් / එක් රාත්‍රියක් |
| ප්‍රවාහන සමාගමක් | එක් මඟියෙකු සඳහා කි. මීටර් එකක් |
| සිමෙන්ති නිපදවන සමාගමක | ටොන් එකක් |

## සංයුක්ත පිරිවැය ඒකකය (Composite Cost Unit)

යම් පිරිවැය ඒකකයක් උප කොටස් දෙකකින් හෝ කිහිපයකින් නිර්මාණය වේ නම්, එය සංයුක්ත පිරිවැය ඒකකයක් ලෙස හැඳින්වේ. නිදසුනක් ලෙස ප්‍රවාහන කර්මාන්තයේ භාණ්ඩ ප්‍රවාහනයට අදාළව පිරිවැය ඒකකය ලෙස "ටොන් එකක් කිලෝමීටරයක්" (Per tonne Km) භාවිත කෙරේ. මෙහිදී '''ටොන් එකක්'' හා ''කිලෝමීටරයක්'' ලෙස කොටස් දෙකක් ඇති නිසා මෙය සංයුක්ත පිරිවැය ඒකකයකි. එය තාර්කික ද වේ.

**පිරිවැය මධ්‍යස්ථානයක් (Cost Centre) යනු?**

*පිරිවැයකරණයේදී, පිරිවැය එක් රැස්වන ස්ථානයක්, කාර්යයක් උපකරණයක් හෝ පුද්ගලයෙක් පිරිවැය මධ්‍යස්ථානයක් ලෙස සැලකේ. (ප්‍රායෝගිකව ඇතැම් අවස්ථාවලදී පිරිවැය මධ්‍යස්ථානය හා පිරිවැය ඒකකය යන දෙකම එකක් විය හැක)*

උදා:

ස්ථානයක් → ගබඩාව, ආපන ශාලාව
කාර්යයක් → රෙදි කැපීමේ, මැසීමේ හා නිම කිරීමේ
පුද්ගලයෙක් → එක් විකුණුම් නියෝජිතයෙක්
උපකරණයක් → රෙදි කැපීමේ යන්ත්‍රයක්, ඡායාරූප මුද්‍රණ යන්ත්‍රයක් වැනි

පිරිවැයකරණයේදී , මුලින්ම පිරිවැය එක් එක් මධ්‍යස්ථාන වලට එකතු වීමට ඉඩ හැර පසුව ඒ ඒ පිරිවැය මධ්‍යස්ථානය තුළ නිපදවූ පිරිවැය ඒකකයන්ට සම්බන්ධ කෙරේ.